## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම (සීමිත) -2019

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර පත්වීම් දරණ හා එම පත්වීම ස්ථිර කරනු ලැබූ සංවර්ධන නිලධාරී (නිති) , කළමනාකරණ සහකාර හෝ ඊට ඉහළ තනතුරක් දරණ පහත සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ."

1. **සුදුසුකම්**

1.1. බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුළ සංවර්ධන නිලධාරී (නීති) තනතුරක් දැරීම

සහ

1.2. නීති විද්‍යාලයේ අවසන් පරීක්ෂණය සමත්වී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

හෝ

1.3. නීති විද්‍යාලයේ අවසන් පරීක්ෂණ සමත්වී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම්දී පළාත් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ බස්නාහිර පළාත්, පළාත් පාලන ආයතනයක නීති අංශයේ හෝ නීති නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ වසර තුන(03)ක පළපුරුද්ද සහිතව බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර හෝ ඊට ඉහළ තනතුරක් දැරීම

2. **පළපුරුද්ද**

නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව නීති කටයුතු පිළිබඳ වසර තුන (03) ක පළපුරුද්දක් තිබීම.

3. **පොදු සුදුසුකම්**

3.1. යහපත් චරිතයකින් යුක්ත වීම.

3.2. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට්පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4. **වයස් සීමාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු වූවන් බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.

5. **බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත විභාගයේ ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන අතර මූලික සුදුසුකම් හා සහතික පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. විභාගය කොළඹදී පවත්වනු ලැබේ.

| විෂයන් | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| නීතිය | • ශ්‍රී ලංකාවේ නීති ක්‍රම<br>  • ගිවිසුම් නීතිය<br>  • නියෝජ්‍යත්ව නීතිය<br>  • පරිපාලන නීතිය<br>  • ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය හා අධිකරණ සංවිධානය<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව(විශේෂයෙන් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරේ.)<br>• මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් | පැය 02 | 100 | 40 |
| සාමාන්‍ය බුද්ධිය | පදගත,සංඛ්‍යාත්මක සහ රූපකාර සන්දර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධ අයදුම්කරුවන්ගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40 |

6. **පවත්වනු ලබන බලධරයා** - බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7. **අදාල වැටුප් පරිමාණය**

7.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - 03/2016 අනුව SL-01 – 2016

7.2. රු. 47,615-1,335 X 10-1,630X8-2,170 X 17- 110,895/- වේ.

7.3. වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛණ II හි සඳහන් පරිදි වේ.

8. **අයදුම් කිරීමේ ක්‍රමය**

සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු වේ.මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු 600/- කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය.එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

9. **අයදුම්පත් එවිය යුතු ආකාරය**

අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **<u>2019.07.25</u>** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් මගින් ඔවුන්ගේ නිර්දේශද සහිතව " **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බස්නාහිර පළාත), අංක109 , මහා වීදිය , බත්තරමුල්ල** " යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " **<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම (සීමිත) - 2019</u> "** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය වන / නොවන සියළු කරුණු පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

10. **අයදුම්පත්‍රය සම්පූර්ණ කළයුතු ආකාරය**

අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත්අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 07 තෙක් පළමු පිටුවටද අංක 08 සිට ඉදිරියට අනෙක් පිටුවලටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

11. **සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම**

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී,ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්,එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්,ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. **විභාග ක්‍රමය:**

12.1. මෙම විභාගය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

12.2. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.

13. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල ලේඛණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මඟින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

14. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

15. මෙම නිවේදනය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

20 මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

හේමන්ත සමරකෝන්
ලේකම් (වැ.බ.)
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2019.07.

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගය (සීමිත) - 2019

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

භාෂා මාධ්‍යය

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

(අදාල කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

1.

1.1. අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා:PERERA A.B.C.D

1.2. සම්පූර්ණ නම : ..........................................................................................................................
..........................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3. සම්පූර්ණ නම : ..........................................................................................................................
(සිංහලෙන්)

1.4. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.

2.1. ස්ථිර ලිපිනය : ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2. ස්ථිර ලිපිනය : ..........................................................................................................................
(සිංහලෙන්)

2.3. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය

i. සිංහලෙන් : ..........................................................................................................................
..........................................................................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් : ..........................................................................................................
..........................................................................................................................................

2.4. ස්ත්‍රී / පුරුෂ භාවය ස්ත්‍රී - 1 පුරුෂ - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.

3.1. දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .......................................................................................................

3.3. පදිංචිව සිටින කාල සීමාව : ............................................................................................................

3.4. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද ? ..........................................................

4.

4.1. විවාහක / අවිවාහක බව - විවාහක - 2, අවිවාහක - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.2. උපන්දිනය - වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.3 අයදුම්පත් කැඳවන දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

5.

5.1. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

5.2. පළපුරුද්ද

නීතිඥයෙකු වශයෙන් දිවුරුම්දීමෙන් පසුව නීති කටයුතු පිළිබඳව වසර 03ක පළපුරුද්දකක් ලබා තබීම

............................................. සිට ................................................... දක්වා

6. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරුනු ලැබ තිබේද?
(අදාල කොටුව තුළ √ ලකුණ යොදන්න)
ඔව් - ☐ නැත - ☐

7. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

7.1. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ...............................................................................

7.2. ලදුපත් අංකය හා දිනය : ........................................................................................................................

7.3. ගෙවූ මුදල : .............................................................................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

8. අයදුම්කරුගේ ප්‍රකාශය

...........................................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුසුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරි 111 ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය : ................................................ ............................................................

අයදුම්කරුගේ අත්සන

9. ආයතන ප්‍රධානියාගේ සහතිකය

........................................................................................ මයා/ මෙනවිය/ මිය ගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ................................ දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................. තනතුරට පත්කර ඇති බවත් , ඔහු/ඇය ................................... දින සිට සේවයේ ස්ථිර කර ඇති බවත්, එම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවත් ................................................. ........................... අමාතත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ආයතනයේ ........................................................ වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහු /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

......................................................

දිනය .............................. ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිලමුද්‍රාව

10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.02 දිනැතිව අනුමත කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිති නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියට අනුව ........................................... මහතා/ මිය/ මෙනවිය සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි.

දිනය .........................

...........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිලමුද්‍රාව

11. අමාත්‍යංශ ලේකම්ගේ නිර්දේශය

ඉහත නිර්දේශය සමග එකඟ වෙමි./නොවෙමි.

දිනය-..........................................

…........................................................
අමාත්‍යංශ ලේකම් (බ.ප.) ගේ
අත්සන හා නිලමුද්‍රාව

12. ප්‍රධාන ලේකම් (බ.ප.) ගේ නිර්දේශය

ඉහත අයදුම්පත නිර්දේශ කරමි.

දිනය-..........................................

…........................................................
ප්‍රධාන ලේකම් (බ.ප.) ගේ
අත්සන හා නිලමුද්‍රාව